**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்**
**Sabaragamuwa Provincial Department of Education**

| | | |
|---|---|---|
| **පළමු වාර පරීක්ෂණය** | **2018** | **9 ශ්‍රේණිය** |
| **முதலாம் தவணைப் பரீட்சை** | **2018** | **தரம் 9** |
| **First Term Test** | **2018** | **Grade 9** |

| | |
|---|---|
| ***දේශීය නර්තනය – I,II*** | ***පැය 2 යි*** |
| ***Dancing - I,II*** | ***2 hours*** |

නම/විභාග අංකය :- ...........................................................................................

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 1 සිට 20 ප්‍රශ්නවල නිවැරදි හා වඩාත් ම සුදුසු පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) නර්තනයේ මූලික ඉරියව්ව වනුයේ,

i. චලනය. ii. වන්දනා කිරීම iii. සරඹ නැටීම iv. මණ්ඩිය.

(2) නමස්කාර සරඹය, දෙවන වැදුමෙන් අපේක්ෂා කරනුයේ,

i. බුදුන්වහන්සේගෙන් අවසර ගැනීම. ii. ගුරුන්ගෙන් අවසර ගැනීම.
iii. දෙවියන්ගෙන් අවසර ගැනීම. iv. දෙගුරුන්ගෙන් අවසර ගැනීම.

(3) චරිත නිරූපනයේ දී ඉතාම වැදගත් වනුයේ,

i. අංග චලනය. ii. භාව ප්‍රකාශනය. iii. ගායනය. iv. රංග වස්ත්‍රාභරණ.

(4) දේශීය නර්තන සම්ප්‍රදායන්ට අනුව නර්තනයට පාද හුරුකර ගැනීම සඳහා අභ්‍යාස කළයුතු වන්නේ,

i. පා සරඹ, මණ්ඩි පද ii. පා සරඹ, දොම්න පද
iii. පා සරඹ, ඉලංගම් සරඹ iv. පාසරඹ, වන්නම්.

(5) 7 වන ගොඩ සරඹයේ, සරඹ නාමය,

i. ඇල සරඹය. ii. දෑත පෑගීමේ සරඹය iii. දෑල සරඹය iv. අංගහාර සරඹය

(6) තාලම්පටින් නිපදවිය හැකි ධ්වනි දෙක,

i. සම ග්‍රහ, අව ග්‍රහ, නම් වේ. ii. අඩ, මාධ්‍ය නම් වේ.
iii. ක්ෂණාන්ත, හීනාන්ත නම් වේ. iv. අඩු ,වැඩි නම් වේ.

(7) තාලය හා සම්බන්ධ තිතක් සෑදීම අවශ්‍ය අවම මාත්‍රා ගණන හා උපරිම මාත්‍රා ගණන පිළිවෙලින්,

i. 2 හා 3 කී. ii. 2 හා 4 කි. iii. 3 හා 4 කි. iv. 4 හා 3 කි.

(8) ත්‍රිවිධ ලය,

i. විලම්භ, මධ්‍ය, දෘත ii. සම ග්‍රහ, අව ග්‍රහ, විෂම ග්‍රහ
iii. උඩ, මැද, යට iv. තිත් ,තිත්, තෙයි.

(9) අනාසාතාත්මක ගැමි ගී වලට අයත් වේ.,

i. කරත්ත කවි, පතල් කවි ii. කරත්ත කවි, කඩතුරා කවි.
iii. සවරම් කවි, ගාලම් කවි. iv. නෙළුම් කවි, නා ලී කවි

(10) උඩරට සිංහරාජ වන්නම අයත් තාල රූපය ,

i. මාත්‍රා 2+4 දෙතිතේ තාලය
ii. මාත්‍රා 4+4 තනි තිතේ තාලය
iii. මාත්‍රා 3+3 තනි තිතේ තාලය
iv. මාත්‍රා 2+3 දෙතිතේ තාලය

(11) සම්ප්‍රදායික වන්නමක්, නර්තනයේ දී ,

i. රිද්මයාණුකුල චලන භාවිතා කරයි.
ii. අභි චලන භාවිතා කරයි.
iii. තාලාණුකුල චලන භාවිතා කරයි.
iv. ප්‍රකාශණාත්මක චලන භාවිතා කරයි.

(12) ''සුරත්තට්ටුව'' යනු ,

i. වාදන භාණ්ඩයකි.
ii. වාදන උපකරණයකි.
iii. දිග ප්‍රමාණයකි.
iv. බෙරයේ දකුණැස ආරක්‍ෂක වැස්ම.

(13) ගැට බෙරයේ සම්මත දිග ප්‍රමාණය,

i. තුන් වියත් තුන ගුලකි.
ii. වියත් තුකි.
iii. අඩි තුනකි.
iv. විග් ගුස්සකි.

(14) මේවා ගැට බෙරයේ කොටස් ය.,

i. වරපට , කැපුම් හම, විග්ගුස්ස
ii. වරපට, කැපුම්හම, වෙනිවර කැරැල්ල
iii. කැපුම හම, බෙර කඳ, විග්ගුස්ස
iv. බෙර ඇස, බෙර ලණුව, විග්ගුස්ස

(15) සිහින් සිනිඳු සළුව පැළැද විත් උන් මරඟන
වහන්ස නුඹ අප අතහැර මන්ද මහණ උණ
අහංකාර ඒ මරඟන දැක්කේ බුදු ගුණ
මිහින්තලා ධාතු බලෙන් කඩතිර හරි මින
ඉහත සඳහන් කවිය ,

i. වන්නමක කවියකි.
ii. ගොයම් කවියකි
iii. කඩතුරා කවියකි.
iv. ග්‍රහ පන්ති කවියකි.

(16) නිවසේ දී සෞන්දර්ය වැඩ සටහන් ද නැරඹීමට හැකි සුලබ රූපවාහිනී, මාධ්‍ය ය,

i. ශ්‍රව්‍ය මාධ්‍යයකි.
ii. දෘශ්‍ය මාධ්‍යයකි.
iii. මුද්‍රිත මාධ්‍යයකි.
iv. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයකි.

(17) දේශීය නර්තන සම්ප්‍රදායන් පහසුවෙන් ම හඳුනා ගත හැකි වන්නේ ,

i. හස්ත චලන හා ඇඳුම් පැළඳුම් වලිනි.
ii. හස්ත චලන හා පද න්‍රතනයෙනි.
iii. හස්ත චලන හා ගායනා වලනි.
iv. නර්තනයෙන් හා ගායනා වලිනි.

(18) දේශීය නර්තන සම්ප්‍රදායන් තුනටම පොදු වූ ශාන්තිකර්මය,

i. කොහොඹා කංකාරිය
ii. බලි
iii. පහන් මඩුව
iv. දෙවොල් මඩුව

(19) දිසා තල රටා මෝස්තර සම්බන්ධතා යන සංකල්ප,

i. ත්‍රිවිධ චලන හා බැඳී පවතී.
ii. ප්‍රස්තාර කිරීම හා බැඳී පවතී.
iii. අවකාශ භාවිතය හා බැඳී පවතී.
iv. අභිනය හා බැඳී පවතී.

(20) ශාරීරික සෞඛ්‍යය මනාව පවත්වා ගනිමින් නර්තනයේ යෙදෙන විට ,

i. කායික ශක්තිය ගොඩ නැගේ.
ii. රිද්මය ගොඩ නැගේ.
iii. වේගය ගොඩ නැගේ.
iv. වේගය හා රිද්මය ගොඩ නැගේ.

ලකුණු - 20

## නර්තනය- II (දේශීය)

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 3 කට පිළිතුරු සපයන්න.**
- **හිස්තැනට සුදුසු පිළිතුරු ලියන්න.**

01. (i) ජන ගායනා සරල බවින් යුතු වුව ද ශාන්තිකර්ම ගායනා හා වන්නම් ...................................... බවින් යුක්ත වේ.

(ii) නර්තන විෂයේ ලිඛිත කොටස් හා .................................... කොටස් අතර මනා සම්බන්ධතාවය ඇතිව අධ්‍යයනය කළයුතුය.

(iii) රන් දෑ කැති ගෙන නිති සැර සෙනවා මේ කවියේ දෙවන පදය,

..............................................................................................................................................................................

(iv) දේශීය වාද්‍ය භාණ්ඩ අතර මුහුණත සමින් සකස් කර ඇති භාණ්ඩ ........................................................ නම් වේ.

(v) බෙරයේ දකුණැස ආරක්ෂක වැස්ම ලෙස ................................................................. යන කොටස භාවිතා කෙරේ.

(vi) මූලික සරඹ අභ්‍යාස කිරීමේ දී සමගුණ, දෙගුණ, සිව් ගුණ වශයෙන් ..................................................... ට අනුව ප්‍රගුණ කළ යුතුය.

(vii) උඩරට කස්තිරමට සමානව සබරගමුව කලාසම ද පහතරට ................................................ ද දැක්විය හැකිය.

(viii) ∧ , / , ◡ මෙම සංකේත ප්‍රස්තාරයේ නිසි තැන්වල යොදන්න.

| | | | |
|---|---|---|---|
| | | | |
| 1 2 | 1 2 3 | 1 2 | 1 2 3 |
| දොං - | ජිං - ත | ග ත | දොං - ත |

(ලකුණු - 10)

(02) (i) දෙති තේ ප්‍රභේද කීය ද.?

(ii) ඒවා නම් කරන්න.

(iii) නම් කරන ලද ප්‍රභේද වලින් දෙකකට අයත් කවිය බැගින් ප්‍රස්තාර කරන්න.

(ලකුණු - 10)

(03) (i) ගැටබෙරය / පහතරට බෙරය / දවුල යන භාණ්ඩ වලින් එකක, පැහැදිලි, නිවැරදි රූප සටහනක් ඇද කොටස් නම් කරන්න.

(ii) අඳින ලද භාණ්ඩය පිළිබඳව විස්තර ඇතුළත් වාක්‍ය 05 ක් ලියන්න.

(ලකුණු -10)

(04) (i) ගොඩ සරඹ / ඉලංගම් සරඹ / දොඹින පද / ප්‍රගුණ කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

(ii) ශාරීරික ස්වස්ථතාව පවත්වා ගැනීම සඳහා දිනපතා කළ යුතු කාර්ය 5 ක් ලියන්න.

(ලකුණු -10)